# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2139/40 - 2019 සැප්තැම්බර් මස 04 වැනි බදාදා - 2019.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 94/47 (v)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''වේරගල ලෙනගල රජමහා විහාර භූමිය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත්කරනු ලැබූ වේරගල ලෙනගල රජමහා විහාර භූමිය සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***වේරගල ලෙනගල රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

ස්ර්වේයර් ජනරාල්ගේ 2019 ජනවාරි මස 18 දිනැති අංක KE/WRK/2018/203 දරන අනුරේඛනයේ කැබලි අංක A, කැබලි අංක C, කැබලි අංක D, කැබලි අංක F සහ කැබලි අංක H වශයෙන් නිරූපිත සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 90 A, පහළලෙනගල ග්‍රාම නිලධාරී වසමේ වේරගල ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර 6.1742 ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :-

| | | |
|---|---|---|
| කැබලි අංක | : | A |
| *උතුරට* | : | ගුලනහේන, ප්‍රාදේශීය සභා මාර්ගය සහ කැබලි අංක B |
| *නැගෙනහිරට* | : | කැබලි අංක B සහ හිටිනාවත්ත |
| *දකුණට* | : | මාරගස්පිටිය, ගල්ගොඩහේන සහ කොණ්ඩාගල |
| *බටහිරට* | : | කොණ්ඩාගල සහ ගුලනහේන |

1A - G 30888 — 27 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| කැබලි අංක | : | C |
| *උතුරට* | : | මාණලියද්ද |
| *නැගෙනහිරට* | : | මාණලියද්ද සහ කැබලි අංක D |
| *දකුණට* | : | කැබලි අංක E සහ කැබලි අංක B |
| *බටහිරට* | : | කැබලි අංක B |

| | | |
|---|---|---|
| කැබලි අංක | : | D |
| *උතුරට* | : | මාණලියද්ද සහ මාර්ගය |
| *නැගෙනහිරට* | : | තැන්නපිටවත්ත |
| *දකුණට* | : | කැබලි අංක E, මාර්ගය |
| *බටහිරට* | : | කැබලි අංක C |

| | | |
|---|---|---|
| කැබලි අංක | : | F |
| *උතුරට* | : | තැන්නපිටවත්ත |
| *නැගෙනහිරට* | : | තැන්නපිටවත්ත |
| *දකුණට* | : | කැබලි අංක G සහ කැබලි අංක B |
| *බටහිරට* | : | කැබලි අංක B |

| | | |
|---|---|---|
| කැබලි අංක | : | H |
| *උතුරට* | : | කැබලි අංක G |
| *නැගෙනහිරට* | : | හිටිනාවත්ත |
| *දකුණට* | : | හිටිනාවත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය සහ කැබලි අංක B |
| *බටහිරට* | : | කැබලි අංක B |

09 - 588

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.